# ථෙරවාද සම්ප්‍රදායයේ භාෂා මාධ්‍යය

ආචාර්ය ඩබ්.ඇම්. දේශප්‍රිය ගුණසේන

බුද්ධ පරිනිර්වාණයෙන් සත් දිනකින්[1] එළඹි ආසන්න සාධක මත, පරිනිර්වාණයෙන් තෙ මසකින්, ඇසළ මස අව පෑලවිය දා,[2] වස් එළඹ, නිකිණි මස අවදියවක දා,[3] පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගිත්වයෙන් පළමු ධර්ම සංගීතිය පැවැත්විය. මෙය පඤ්චසතිකා විනයසංගීති[4] යැයි කියනු ලැබේ. මෙයින් පිළිගත් ධර්ම විනය ග්‍රන්ථ සමූහය පාළි ත්‍රිපිටකය ලෙස හෝ ත්‍රිපිටක පාලිය[5] ලෙස හෝ හැඳින්වේ. මෙහි 'පාළි' යන විශේෂණය මුලට යෙදීම තුළින් හෝ අගට යෙදීම තුළින් හෝ ප්‍රකට වන වෙනසක් නැත. මේ දෙයාකාරයෙන් ම[6] භාවිත වේ. ක්‍රි.පූ. 3 වැනි සියවසෙහි මෙහි වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේ සංගීති තුනට නැඟුණු ත්‍රිපිටකයත්, අට්ඨකථාත් යන සියලු ථෙරවාදය උපාධ්‍යායයන් වහන්සේ වෙතින් ඉගෙන වැඩම කළ බවත්,[7] උන්වහන්සේ රැගෙන පැමිණි මහාඅට්ඨකථාව සිංහල භාෂාවට නැඟූ බවත්,[8] සඳහන් වේ.[9] මිහිඳු මහරහතන් වහන්සේ හා මහා අරිට්ඨ ආදි ලක්දිව

---

1 අජ්ජ සත්තාහපරිනිබ්බුතො සමණො ගොතමො, චුල්ලවග්ගපාළි, 544 පි.

2 තෙහි ථෙරා ආසාළ්හි පුණ්ණමාය උපොසථං කත්වා, සාරත්ථදීපනී, 48 පි.

3 සාරත්ථදීපනී, 50 පි. සුමංගලවිලාසිනී, 08 පි.

4 චුල්ලවග්ගපාළි, 564 පි.

5 පිටකත්තය පාළිංච, දීපවංසො, 20 පරි. 20 ගා.

6 මහාවග්ගපාළි, ප්‍රස්තාවනා, ඩංසල පි.

7 සමන්තපාසාදිකා, ෂ, 30 පි.

8 සීහළට්ඨ කථා සුද්ධා - මහින්දෙන මතීමතා
සංගීතිත්තය මාරූළ්හං - සම්මා සම්බුද්ධදෙසිතං
මහාවංසො, 37 පරි., 227 ගා. 222 පි.

9 විනයාලංකාර, 14 පි.
* මගධ බසින් වැටෙමින් ආ බුදුකැලි අටුවා හෙළදිව ඇජුරෝ හෙළ බසින් කැටුහ. ඔවුන් තුබූ නියායෙන් තුමින් අටුවා කරනතාක් සිටි බැවින් සංගීතා යුත.

ථෙරවරුන් හෙළ බසින් තැබූ අට්ඨකථා[10] බුද්ධඝෝෂාදී ආචාර්යවරුන් ක්‍රි.ව. 5 වැනි සියවසේ දී දේශාන්තර භාෂාවට පරිවර්තනය කළ බවත් කියවේ.[11] මෙසේ සංගායිත ත්‍රිපිටක පාළියත්, එහි ම ඇතුළත් අට්ඨකථාත්, පාළිමුත්තක අට්ඨකථාත් යන සියල්ල ථෙරීය ආචාර්යවරුන් විසින් පාළිය ලෙසින් ගන්නා ලදහ[12] යැයි දැක්වේ. මෙහි පාළිය ලෙස පිළිගෙන ඇත්තේ සීහළට්ඨකථාවන් දේශාන්තර භාෂාවට පරිවර්තනය වීමෙන් සංගෘහීත පාළිමුත්තක අට්ඨකථා සම්ප්‍රදාය යි. මාගධී ත්‍රිපිටක ධර්ම සාහිත්‍යයෙහි ඒ ඒ සාහිත්‍ය ප්‍රභේදයන්හි විද්‍යමාන විශේෂතා තුළ නූතන විද්වතුන් ප්‍රභේද කළත්, ථෙරවාද සම්ප්‍රදාය තුළ නම් ඊට අවසරය නො ලැබේ. එබැවින් පාළිමුත්තක අට්ඨකථා සම්ප්‍රදාය ද පෙළ සෙයින් ම පිළිගෙන තිබේ. පූර්වෝක්තයෙහි ඇතුළත් 'ථෙරවාද' හා 'පාළි' යන ව්‍යවහාරයන්හි ඓතිහාසික සම්බන්ධය ද මූලාශ්‍රය නයින් විමර්ශනය කළයුතු වේ.

මෙහි 'ථෙරවාද' යන්නෙහි භාවිත වාච්‍යාර්ථ දෙකකි. එනම්,

1. බුද්ධි ප්‍රභාවයේ ඥානාංග ප්‍රකාශිතාර්ථය
2. සම්ප්‍රදායවාචී ස්ථවිරවාදාර්ථය යනු යි.

ශ්‍රී මුඛ පාළිය තුළ ථෙරවාද පාලි ප්‍රයෝගය ඤාණවාද යන්න සමග බද්ධ ව යෙදෙයි.[13] බෝසතාණන් වහන්සේ කිංකුසලගවේසී ව ආළාරකාලාම - උද්දකරාමපුත්ත තාපසවරුන් වෙතින් ලැබූ ඥානය ප්‍රකට කළ අවස්ථාව ඉන් කියැවේ. 'ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච' යන ප්‍රයෝගය තුළ ඉපැරණි භාරතීය අධ්‍යාපනයේ 'ශ්‍රැතිය - ශ්‍රවණය' ප්‍රමාණ කොට ගත් ඥානවිභාගීය ක්‍රියාවලියක අංග දෙකක් ප්‍රකට වෙයි.[14] ශ්‍රැති-ශ්‍රවණ ක්‍රියාවලියේ යමක් දැන

10 ධම්මපියාඅටුවාගැටපදය, 05 පි.
11 විනයාලංකාර, 14 පි.
12 පාලිං ගහුං ථෙරයිවාචරියා, දීපවංසො, 23 පරි., 30 ගා, 09 පි.
ථෙරියාචරියා සබ්බෙ - පාළිං විය තමග්ගහුං, මහාවංසො, 37, 245 ගා., 223 පි.
13 සො ඛො අහං භික්ඛවෙ තාවතකෙනෙව ඔට්ඨපහතමත්තෙන ලපිතලාපනමත්තෙන ඤාණවාදඤ්ච වදාමි ථෙරවාදඤ්ච (ඒ මම උන් කී දය තොල් පහළ පමණින් ම උන් කී දය නැවත කීම් පමණකින් ම දනිමි යි යන කථාවත්. මම එහි ස්ථිරයෙමි යන කථාවත් කීවෙමි)
මජ්ඣිම නිකාය, ම, අරියපරියෙසන සුත්ත, 400 පි.
මහාසච්චක සුත්ත, 566 පි.
එම, ෂෂ, සංගාරව සුත්ත, 740 පි.
බොධිරාජ කුමාර සුත්ත, 484 පි
14 ශාස්ත්‍රීය සංග්‍රහය, 115 පි.

ගත් බව, වටහා ගත් බව, අවබෝධයක් ලද බව ප්‍රකාශ කිරීම ඤාණවාදය යි. එසේ දැන ගත් දෙය ස්මරණය වීම, ධාරණය වීම, අවබෝධය ස්ථිර වීම, තහවුරු වීම, ප්‍රකාශිත අවස්ථාව ථේරවාදය යි. මෙයින් දැනීම හා අවබෝධය යන බුද්ධි අංග දෙක වාච්‍ය වේ යැයි සිතිය හැකි ය. උක්ත ප්‍රයෝගයෙහි අටුවා විග්‍රහය වන්නේ, "ඤාණවාදය යනු දනිමි යන වාදය යි, ථේරවාදය යනු ස්ථිරවෙමි යන වාදය යි."[15] යනුවෙනි. එම විග්‍රහය තුළ ද පූර්වයෙහි දක්වූ අර්ථය ම තහවුරු කොට තිබේ. ඉපළෙහි එන ථේරවාද පාලි ප්‍රයෝගය යෙදී ඇති සන්දර්භය, සම්ප්‍රදායවාචී ස්ථවිරවාදය සඳහා ථේරවාද ව්‍යවහාරය නො යෙදිය හැකි බව කියයි.[16] එහෙත් මෙය සසඳා බැලීම වැදගත් වේ.

සම්ප්‍රදායවාචී ස්ථවිරවාදාර්ථ 'ථේරවාද' ව්‍යවහාරය විද්‍යමාන පැරණි මූලාශ්‍රය වන්නේ, දීපවංස[17], මහාවංස[18], සමන්තපාසාදිකා[19] ආදිය යි. මේ අතර පැරණිතම මූලාශ්‍රය ක්‍රි.ව. 04 වැනි සියවසට අයත් දීපවංසය යි. ධර්ම-විනය සංගීති වාර්තා අතර පැරණිතම මූලාශ්‍රය චුල්ලවග්ග පාලියේ පඤ්චසතිකක්ඛන්ධකය හා සත්තසතිකක්ඛන්ධකය යි. එම වාර්තාවන්හි 'ථේරවාද' ප්‍රයෝගය හඳුනාගත නො හැකි ය. දෙවැනි ධර්ම සංගීති වාර්තාවෙහි ද ශ්‍රාවක භික්ෂු සංඝයා හැඳින්වීමට 'සමණා සක්‍යපුත්තියා - ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ'[20] යැයි භාවිත වේ.

මුල් බුදුසමය ථේරවාදයට පරිවර්තනය වීමේ[21] කඩයිම් ලක්ෂණය වන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් සියවසකින් එළඹි දෙවැනි ධර්මසංගීතිය යි. දෙවැනි ධර්මසංගීති වාර්තාවෙහි 'ථේරවාද' ව්‍යවහාරය සඳහන් නො වූවත්, එම ධර්ම සංගීතිය පිළිගත් භික්ෂු පිරිස ථේරවාද (ස්ථවිරවාද) වූ අතර ඒව

---

15 ඤාණවාදන්ති ජානාමීති වාදං ථේරවාදන්ති ථිරභාවවාදං ථෙරො අහමෙත්ථාති එතං වචනං, පපඤ්චසූදනී, 377 පි.

16 මුල් බුදුසමයේ විවරණ ගැටලු, 10 පි.

17 තෙහි ච'ඤ්ඤෙහි ථෙරෙහි - කතාහිචෙව සාධූහි
පඤ්චසතෙහි ථෙරෙහි - ධම්මවිනයසංගහො
ථෙරෙහි කතසංගහො - ථෙරවාදොති වුච්චති
දීපවංසො, 04 පරි., 4, 11, 17, 18, 31, 32, 33 පද්‍ය

18 එසො'ව ථෙරවාදො සො - ආදිවස්සසතෙ අහූ
මහාවංසො, 05 පරි, 1, 2, 3 ගාථා.

19 සමන්තපාසාදිකා, I, බාහිර නිදානය

20 චුල්ලවග්ගපාළි, II, සත්තසතිකක්ඛන්ධකය, 566, 572 පිටු.

21 මුල් බුදුසමයේ විවරණ ගැටලු, 08 පි.

විරුද්ධ ව නැගී සිටි භික්ෂු පිරිස මහාසාංඝික[22] නාමින් ප්‍රකට විය. දෙවැනි ධර්මසංගීතියෙන් නෙරපනු ලැබූ[23] පිරිස අති විශාල යි.[24] එම පිරිසේ උගත් මහතෙරවරුන් දසදහස් දෙනෙක් රැස්ව[25] පාටලීපුත්‍රයේ දී මහාසංගීතියක් පැවැත් වූ බවත්, වජ්ජිපුත්තක භික්ෂූන්ගේ ඒ අදහස් මතයන් යෝග්‍ය යැයි පිළිගත මහාසාංඝික නිකාය පිහිටුවා ගත් බවත් කියැවේ. මහා සංඝයාට අයත් හෝ මහපිරිස් ඇති [26] හෙයින් මහාසාංඝික යැයි කියනු ලැබේ. එහෙත් චීන දේශාටක හියුං සියැං වාර්තා කරන්නේ, "රහතුන් හා පෘථග්ජනයන් මිශ්‍ර ව පැවැත් වූ බැවින් මහාසංඝයාගේ සම්මේලනය" යැයි නාම කරනු ලැබූ[27] බව යි.

බුද්ධශ්‍රාවක භික්ෂු පිරිස හැඳින්වීම සඳහා කාලානුක්‍රමික ව භාවිත වූ යෙදුම් කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

1. සමණා සක්‍යපුත්තියා - ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ [28] (බුද්ධ පරිනිර්වාණයෙන් ගත වර්ෂයකින් පැවැත් වූ දෙවැනි ධර්ම සංගීතිය තෙක්)

2. ථේරවාද - මහාසාංඝික (දෙවැනි ධර්ම සංගීතියෙන් බැහැර කරනු ලැබූ භික්ෂූන් අතුරින් දසදහසක් දෙනාගේ සහභාගිත්වයෙන් පාටලීපුත්‍රයෙහි පැවැත්වූ සංගීතියෙන් පසු [29])

3. හීනයාන - මහායාන (ක්‍රි.ව. 120 - 162 පුරුෂපුරයෙහි කුණ්ඩලවන විහාරයේ දී පවත්වනු ලැබූ සතරවැනි කණිෂ්ක සංගායනාවෙන් පසු[30]) යනුවෙනි.

---

22 දීපවංසො, 04 පරි, ආචරියවංස භෙද, 69, 70 ගා. 24 පි.

23 නික්කඩ්ඪිතා පාපභික්ඛූ - ථෙරෙහි වජ්ජිපුත්තකා
අඤ්ඤං පක්ඛං ලභිත්වාන - අධම්මවාදී බහූජ්ජනා
එම, 04 පරි., 69 ගා, 24 පි.

24 කාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ ස්ථවිර සම්මේලනයට ඇතුළත් කරගනු නොලැබූ ලක්ෂයක් පමණ රහත් නොරහත් භික්ෂු සමූහය මෙතැන රැස්ව.
හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 326 පි.

25 දීපවංසො, 04 පරි., 70 ගා, 24 පි.

26 ථෙරවාද බෞද්ධ දර්ශනය, 03 පි.

27 හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 326 පි.

28 චුල්ලවග්ගපාළි, ෂෂ, 572 පි.

29 ථෙරවාද බෞද්ධ දර්ශනය, 03 පි.

30 විචාරෝභාස, 136 පි.

සමණා සක්‍යපුත්තියා යන්න බුදුරදුන් සිය ශ්‍රාවක භික්ෂු පිරිස හඳුන්වා දීම සඳහා භාවිත කළ පොදු ව්‍යවහාරය යි. බුද්ධ පරිනිර්වාණයෙන් ශත වර්ෂයක් යන තුරු ම ශ්‍රාවක භික්ෂූහු මෙම ව්‍යවහාරයෙන් ම හැඳින්වූහ. දෙවැනි සංගීති වාර්තාවෙන් ඒ බව[31] සනාථ වේ. සබ්බකාමී, යස, රේවත මහරහතුන් ප්‍රමුඛ ව සත්සියයක් මහරහතුන්ගේ සහභාගිත්වයෙන් පැවැත් වූ දෙවන ධර්ම සංගීතියත්[32] එම සංගීතියට ඇතුළත් කර ගනු නො ලැබූ ලක්ෂයක් පමණ රහත් නො රහත් භික්ෂු සමූහයා මිශ්‍ර ව පැවැත් වූ සංගීතියත්[33] නිසා මෙතෙක් අභේද්‍ය ව සිටි බුද්ධශ්‍රාවක භික්ෂූහු නැවත කිසිසේත් එක් කළ නො හැකි ලෙස දෙ කඩ වූහ.[34] තෙරුන් (ස්ථවිරයන්) වහන්සේලා විසින් කරන ලද සංගීතිය බැවින් ථෙරවාද[35] යැයි ද රහත් නො රහත් භික්ෂු සමූහයා මිශ්‍ර ව පැවැත් වූ මහාසංඝයාගේ සම්මේලනය බැවින් මහාසාංඝික[36] යැයි ද කියනු ලැබේ. දෙවැනි ධර්ම සංගීතිය පිළිගත් භික්ෂූහු තුමූ 'ථෙරවාද' යැයි ද එම සංගීතියෙන් නෙරපූ දසවස්තුව පිළිගත් වජ්ජිපුත්තකාදී භික්ෂූන්ගේ මහාසංඝ සම්මේලනය පිළිගත් භික්ෂූහු තුමූ මහාසාංඝික යැයි ද හඳුන්වා ගත්හ.[37] මහාසාංඝිකයින් ප්‍රාකෘත භාෂාව භාවිත කළ බවත්, ඔවුන්ගේ විනය ග්‍රන්ථයක් වූ මහාවස්තුවෙහි එක් කොටසක් සංස්කෘත - ප්‍රාකෘත මිශ්‍ර පද්‍ය භාෂාවෙන් රචනා වී ඇති බවත්[38] මොරටුවේ ශාසනරතන හිමියෝ[39] පවසති.

ක්‍රි.ව. 120 - 162 කණිෂ්ක රාජ්‍ය සමයෙහි පැවැත්වූ (සතර වැනි) සංගීතියට ලංකාවේ ස්ථවිරවාදීන් හැර[40] සෙසු සියලු ම බෞද්ධ නිකායාන්තරිකයෝ සම්බන්ධ වූහ. මේ අවධිය වන විට ස්ථවිරවාදය ලක්දිව පමණක් පැවතුණු බවත්, ස්ථවිරවාදීන් මෙම සංගීතියට සහභාගි නො වූ

---

31 චුල්ලවග්ගපාළි, ෂෂ, 572 පි.
32 චුල්ලවග්ගපාළි, ෂෂ, 598 පි.
33 හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 326 පි.
34 මුල් බුදුසමයේ විවරණ ගැටලු, 08 පි.
35 ථෙරෙහි කත සංගහො - ථෙරවාදොති වුච්චති
දීපවංසො, 04 පරි., 11 ගා., 20 පි.
36 විචාරෝභාස, 135 පි., විමතිවිනොදනී ටීකා, 26 පි.
37 හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 326 පි.
38 මහවග්ගපාළි, ෂ, ප්‍රස්තාවනාව, ඛසං පි.
39 History of India, Vol. p. 76.
40 විචාරෝභාස,136 පි.,

බවත්, එම සංගීතිය සංස්කෘත භාෂාවෙන් ම පැවැත්වූ බවත් [41] සඳහන් වේ. කණිෂ්ක සංගීතිය පිළිගත් භික්ෂූහු තුමූ 'මහායාන' නම් වූ එක ම සම්ප්‍රදායකට අනුව සකස් වූ බවත්, උක්ත නාමය සංගීතිකාරකයන් විසින් ම තමන් හැඳින්වීමට භාවිත කළ අතර අන්‍යයෝ හීනයානිකයෝ යැයි කියනු ලැබූහ. එහෙත්, ථෙරවාදීන්ගේ පෙළ, අටුවා, ටීකා කිසිදු ග්‍රන්ථයක 'හීනයාන - මහායාන ව්‍යවහාරයන් හමු නො වන බව මොරටුවේ ශාසනරතන හිමියෝ[42] දක්වති. මහායාන ව්‍යවහාරය ප්‍රථමයෙන් හමුවන්නේ අශ්වඝෝෂපාදයන්ගේ මහායාන ශ්‍රද්ධෝත්පාද සූත්‍රයෙහි බවත් [43] පෙන්වා දෙති.

ක්‍රි.ව. 06 වැනි සියවසේ චීන දේශාටක හියුං සියැං තෙරුන්, සිය දේශාටන වාර්තාවෙහි ලංකාද්විප ස්ථවිර නිකායික විහාරස්ථාන සියයක විසිදහසක භික්ෂූන්ගේ වාසය[44] වූ බවත්, භාරුකච්ඡ දේශයේ සංඝාරාම දහයක භික්ෂූන් තුන්සියයක් පමණ මහායානයට හා ස්ථවිර නිකායට අයත් වූ බවත් [45] කොංකනපුරයේ සංඝාරාම සියයක දසදහසක් භික්ෂූන් හීනයාන මහායාන සම්ප්‍රදාය දෙක ම උගත් බවත්,[46] මහාරාෂ්ට්‍රයේ සංඝාරාම සියයක පන්දහසක් පමණ භික්ෂූන් හීනයාන - මහායාන දෙකට ම අයත් ව විසූ බවත්,[47] උජ්ජයිනී දේශයේ සංඝාරාම දහයකින් බොහෝමයක් දිරාපත් ව ඇතත් තුන හතරක හීනයානික හා මහායානික භික්ෂූන් තුන්සියයකගේ වාසය ඇති බවත්,[48] චිකිතෝ දේශයේ ආරාම දහයක භික්ෂූන් ටික දෙනෙකු වාසය කළ බවත්,[49] සඳහන් කොට ඇත. උක්ත විස්තරයට අනුව ප්‍රකට වන්නේ, හීනයාන - මහායාන භේදයෙන් හැඳින්වූ භික්ෂූන් ඒ ඒ ප්‍රදේශවල විසූ බව යි. මෙහි හීනයාන යැයි හඳුන්වා ඇත්තේ ද පූර්වයෙහි ථෙරවාද නමින් හැඳින්වූ භික්ෂු සම්ප්‍රදාය යි.

ශ්‍රී ලංකාව, බුරුමය, ථායිලන්තය, කාම්බෝජය හා ලාඕසය යන රටවල පවතින බුද්ධදහම් ප්‍රධාන වශයෙන් ථෙරවාදය[50] යනුවෙන් හැඳින්වේ.

41 එම., 137 පි.
42 එම.,
43 හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 386 පි.
44 එම, 386 පි.
45 එම, 397 පි.
46 හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 392 පි.
47 එම., 395 පි.
48 එම., 405
49 එම.
50 [illegible] ෆ. ප්‍රඥාවංශ, වංස පි.

අර්හත්වය සාක්ෂාත් කිරීම පරම නිෂ්ඨාව ලෙස ගෙන, අර්හත්වය ප්‍රමාණ කොට ගත් වැඩි අවධානයක් යොමු කරන බැවින්, ථෙරවාදය හීනයානය යැයි මහායානිකයෝ දක්වූහ. එහෙත් විශ්ලේෂණයට වඩා සංශ්ලේෂණයට කැමති නූතන බෞද්ධ ලෝකයා, ථෙරවාදීන්ගේ කැමැත්ත පරිදි ථෙරවාදීන් හීනයානිකයින් වශයෙන් නො ව ථෙරවාදීන් වශයෙන් ම හැඳින්වීමට, ලංකාවේ දී ප්‍රථම වරට පවත්වනු ලැබූ ලෝක බෞද්ධ සම්මේලනයේ දී එකඟ වී ඇත.[51] ඒ අනුව බෞද්ධ ලෝකය හැඳින්ත ථෙරවාද හා මහායාන යැයි හැඳින්වීමට ඉදිරිපත් වී ඇතැයි ද පැවසිය හැකිය.

බුදුසමයේ විකාශනය ඓතිහාසික හා එන් කාලානුක්‍රමික ව යුග පරිවර්තනයක් සේ හඳුනා ගන්නට උගත්හු උත්සාහ ගනිති. එහි ලා දෙවැනි ධර්ම සංගීතිය, මුල් බුදුසමය ථෙරවාදයට පරිවර්තනය වීමේ කේන්ද්‍රීය ලක්ෂණය ලෙස හඳුනා ගනිති.[52] මහාචාර්ය නලිනාක්ෂදත්ත, ථෙරවාදයේ වර්ධනීය අවස්ථා දෙකක් ඉදිරිපත් කරයි. එනම්,

1. මූලික ථෙරවාද බුදුසමය (ක්‍රි.පූ. 450 සිට ක්‍රි.පූ. 350 පමණ වනතුරු කාලය)
2. මිශ්‍ර ථෙරවාද බුදුසමය (ක්‍රි.පූ. 350 සිට ක්‍රි.පූ. 100 පමණ වනතුරු කාලය) යනු යි. මෙහි මූලික ථෙරවාද බුදුසමය ලෙස ගෙන ඇත්තේ පළමු ධර්ම සංගීතියේ පටන් දෙවැනි ධර්ම සංගීතිය දක්වා නිකායාන්තර සම්භවයට පෙර අවධිය යි. මෙහි මිශ්‍ර ථෙරවාද බුදුසමය ලෙස සැලකෙන්නේ දෙවැනි ධර්ම සංගීතියේ පටන් ලක්දිව වළගම්බා රාජ්‍ය අවධියේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ පොත්ථකසංගීතිය තෙක් කාලය යි. ථෙරවාදයෙහි වර්ධනීය අවස්ථා හඳුනා ගැනීමෙහි ලා ප්‍රමාණිකත්වයෙන් ගෙන ඇත්තේ දෙවැනි ධර්ම සංගීතිය යි. ඊට පෙර අවධියෙහි එනම්, පළමු ධර්ම සංගීති වාර්තාවේ හා ආරම්භක භික්ෂු පිරිස් අතර 'ථෙර' හා 'වාද' ප්‍රයෝග යන් පදනම් කොට ප්‍රකට වන භේදයක් තිබේ දැයි කෙටියෙන් හෝ විමසා බැලිය යුතු වේ.

ධර්ම විනය පෙළ සාහිත්‍යයට අනුව 'ථෙර' පදයෙහි භාවිතාර්ථ දෙකක් හඳුනාගත හැකිය. එනම්,

---

51 මුල් බුදුසමයේ විවරණ ගැටලු, 09 පි.

52 එම., 08 පි.

1. පැවිද්දෙහි වෘද්ධභාවය ප්‍රකාශිතාර්ථය

2. ආධ්‍යාත්මික ශික්ෂණයෙහි ඵලප්‍රාප්තිය ප්‍රකාශිතාර්ථය යනු යි.

උක්තාර්ථ දෙකින් පළමු වැන්න විමසීමේ දී පෙළෙහි විද්‍යමාන 'භික්ඛු' යන්නට විශේෂණ වූ 'නවා' පදයට විරුද්ධාර්ථ පදයක් ලෙස ගත හැකි ය. එනම්, නවා භික්ඛු[53] (නවක භික්ෂුහු) ථෙර භික්ඛු[54] (ස්ථවිර භික්ෂුහු) මහාථෙරා භික්ඛු[55] (මහා ස්ථවිර භික්ෂුහු) යනු යි. බෞද්ධ ප්‍රව්‍රජ්‍යාවේ උපසම්පත්තියෙන් දස වසරක් දක්වා පැවිද්දෙහි වෘද්ධභාවය 'නවා භික්ඛු' යන්නෙන් ද එහි දසවසරක් පිරීමේ සිට විසිවසර දක්වා වෘද්ධභාවය[56] 'ථෙරා භික්ඛු' යන්නෙන් ද විසිවසරකින් පසු වෘද්ධභාවය 'මහාථෙරා භික්ඛු' යන්නෙන් ද හඳුන්වනු ලැබේ.

පූර්වෝක්තාර්ථ දෙකින් දෙවැන්න විමසීමේ දී පෙළෙහි එන පළමු වැනි හා දෙවැනි සංගීති වාර්තාවන්හි විද්‍යමාන 'භික්ඛු'[57] යන්නට විශේෂණ වූ 'ථෙර' යන්නත්, ඓතිහාසික මූලාශ්‍රයන්හි විද්‍යමාන 'ථෙර'[58] යන්නට විශේෂණ වූ 'මහා' යන්නත් සංඝ යන්නත් කතකිච්ච යන්නත් විශේෂණ රහිත ව යෙදෙන 'ථෙරියා'[59] යන්නත් ඉතා වැදගත් වේ.

---

53 මහාවග්ගපාළි, ෂ, 284 පි, චූලපා., 398 පි.

54 එම, ෂ, 548

55 දීපවංසො, 04 පරි, 09 පද්‍ය, 20 පි.

56 පාලි සිංහල ශබ්දකෝෂය, 296 පි.

57 අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි
චුල්ලවග්ග පාළි, ෂෂ, 546 පි.
අථ ඛො ථෙරා භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං.
එම., ෂෂ, 554 පි.
අථ ඛො ථෙරානං භික්ඛූනං මන්තයමානං එතදහොසි. අ
එම., ෂෂ, 576 පි.

58 අසද්ධෙය්‍යපසී මහාථෙරා, දීව. 04 පරි. 09 ගා, 20 පි.
ඉච්ඡන්තො සො මහාථෙරො,
මහාවංසො. 03 පරි, 05 ගා, 10 පි.
ථෙරො මහාකස්සපොච - සංඝත්ථෙරො තදා අහු,
එම, 03 පරි, 04 ගා, 10 පි.
තෙහි එසද්ධෙහි ථෙරෙහි - කතකිච්චෙහි සාධුහි,
දීපවංසො, 04 පරි, 10 ගා. 20 පි.

59 ථෙරෙහෙව කතත්තා ච - ථෙරියායං පරම්පරා
මහාවංසො, 03 පරි, 40 ගා, 12 පි.

පළමුවැනි ධර්ම සංගීති වාර්තාවෙහි 'ථෙර' විශේෂණයෙන් හඳුන්වන භික්ෂූහු නම 'ස්ථවිර භික්ෂූහු' යැයි අර්ථ දක්වා තිබේ. එනම්, පළමු සංගීතිකාරක මහාකාශ්‍යප ආදී මහරහතන් වහන්සේත්, දෙවැනි ධර්ම සංගීතිකාරක සබ්බකාමී, යස රේවත ආදී මහරහතන් වහන්සේත් [60] ය. ඓතිහාසික මූලාශ්‍රයන්හි මහාථෙර,[61] සංඝථෙර[62] යන්නෙන් හඳුන්වන්නේ ද උන්වහන්සේලා ය. දෙවැනි සංගීතිවාර්තාවෙහි ශාසනයෙහි පැන නැගුණු අධිකරණය හමුවේ පාවා නුවරවැසි සැටක් පමණ ස්ථවිර භික්ෂූහු ද අවන්ති දක්ෂිණාපථවැසි අටාසූවක් ස්ථවිර භික්ෂූහු ද අහෝගංග පර්වතයට රැස්වූහ. අධිකරණ විනිශ්චයෙහි ඉදිරිපත් වන රේවත තෙරුන් වහන්සේ ද යන ස්ථවිර භික්ෂූන්ගේ සුවිශේෂතා රැසක් වාර්තාවෙහි දක්වේ.

එනම්,

1. පාවා නුවරවැසි ස්ථවිර භික්ෂූහු සියල්ලෝ ම ආරණ්‍යක වූ පිණ්ඩපාතික වූ පාංශුකූලික වූ තෛචීවරික වූ රහත් වූ සැටක් පමණ පිරිසකි.[63]

2. අවන්ති දක්ෂිණාපථවැසි ස්ථවිර භික්ෂූහු සමහරෙක් ආරණ්‍යක වූ සමහරෙක් පිණ්ඩපාතික වූ සමහරෙක් පාංශුකූලික වූ සමහරෙක් තෛචීවරික වූ සියල්ලෝ ම රහත් වූ අසූ අටක් පමණ වූ පිරිසකි.[64]

---

60 ලක්දිව මහායාන අදහස්, 31 පි.

61 කුච්ඡන්තෙනා සො මහාථෙරො,
ථෙරො මහාකස්සපො'ච සංඝථෙරො තදා අහු
මහාවංසො, 03 පරි. 05. 04 ගා., 10 පි.
අසද්ධෙසුප'ස්සි මහාථෙරා
දීපවංසො., 04 පරි. 09 ගා. 20 පි.

62 සබ්බකාමී නාම පථව්‍යා සංඝථෙරො වීසංවස්සසතිකො උපසම්පදාය ආයස්මතො ආනන්දස්ස සද්ධි විහාරිකො වෙසාලියං පටිවසති. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ සද්ධිවිහාරික වූ උපසම්පදාවෙන් එක්සිය විසිවස් ඇති මිහි පෘථිවියෙහි සංඝස්ථවිර වූ සබ්බකාමී නම් තෙරුන් වහන්සේ විශාලාවෙහි වැඩ වෙසෙති)
චුල්ලවග්ග පාළි, ෂෂ, 586 පි.

63 අථ ඛො සට්ඨිමත්තා පාවෙය්‍යකා භික්ඛූ සබ්බෙ ආරඤ්ඤිකා සබ්බෙ පිණ්ඩපාතිකා සබ්බෙ පංසුකූලිකා සබ්බෙ තෙචීවරිකා, සබ්බෙ අරහන්තො අහොගඞ්ගෙ පබ්බතෙ සන්නිපතිංසු.
එම., ෂෂ, 576 පි.

64 අට්ඨ අසීතිමත්තා අවන්ති දක්ඛිණාපථකා භික්ඛූ අප්පෙකච්චෙ ආරඤ්ඤිකා

3. ආයුෂ්මත් රේවත ස්ථවිරයන් වහන්සේ ද බහුශ්‍රැත වූ අවබෝධ කළ ආගම ඇති, ධර්මධර වූ විනයධර වූ මාතෘකාධර වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැත්තා වූ ලජ්ජී වූ වරදෙහි කුකුස් ඇත්තාවූ ශික්ෂාකාමී වූ අයෙකි.[65]

පූර්වෝක්ත සියල්ලෝ ම රහතන් වහන්සේලා වූ අතර ධුතාංගධාරී, ප්‍රතිපත්ති ගරුක ව කටයුතු කළ පිරිසකි. ලජ්ජී, කුක්කුච්චකා, සික්ඛාකාමා යන විශේෂණයන්ගෙන් ඒ බව සනාථ වේ. ඓතිහාසික මූලාශ්‍රයන්හි එන සංගීති වාර්තාවල ද ධුතවාද, බහුස්සුත, පණ්ඩිත, දිබ්බචක්ඛු, පටිභාන, ධම්මකථික, චිත්‍රකථී, විභජ්ජන, පටිසම්භිදා, කතකිච්ච[66] යන විශේෂණයන් හඳුනාගත හැකිය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු හැත්තෑ හත් දහසක සම්මුඛශ්‍රාවක, ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ අතුරින් 'සංඝත්ථේර' වූයේ ද මහාකාශ්‍යප තෙරණුවෝ ය.[67] චීන දේශාටක හියුං සියැං තෙරණුවෝ ද සිය වාර්තාවෙහි "රහත්ඵලය ලත්, සෘද්ධිබලය ලැබූ, සියලු රහතන්වහන්සේ රැස් වූ බවත්, උන්වහන්සේලා අතුරින්, ප්‍රතිසම්භිදා ප්‍රාප්ත, ත්‍රිවිද්‍යා - ෂඩ් අභිඥාලාභීන් හැර සෙස්සෝ ඉවත්ව ගියහ"යි සටහන් කරති.[68]

---

අප්පෙකච්චෙ පිණ්ඩපාතිකා, අප්පෙ කච්චෙ පංසුකූලිකා, අප්පෙකච්චෙ තෙචීවරිකා, සබ්බෙව අරහන්තා අභොගංගෙ පබ්බතෙ සන්නිපතිංසු.
එම., ෂෂ, 576 පි.

65 අයං ඛො ආයස්මා රෙවතො සොරෙය්‍යො පටිවසති. බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො.
එම., ෂෂ, 576 පි.

66 ධුතවාදානං අග්ගො සො - කස්සපො ජිනසාසනෙ
බහුස්සුතානං ආනන්දො - විනයෙ උපාලි පණ්ඩිතො
දිබ්බචක්ඛුම්හි අනුරුද්ධො - වංගීසො පටිභානවා,
පුණ්ණොච ධම්මකථිකානං - චිත්‍රකථී කුමාරකස්සපො,
විභජ්ජනම්හි කච්චානො - කොට්ඨිතො පටිසම්භිදා,
අඤ්ඤෙප'පි මහාථෙරා - අග්ගනික්ඛිත්තකා බහූ
තෙහි චඤ්ඤෙහි ථෙරෙහි - කතකිච්චෙහි සාධුහි
පඤ්ච සතෙහි ථෙරෙහි - ධම්මවිනය සංගහො
දීපවංසො., 04 පරි, 07, 08, 09, 10 ගා, 20 පි.

67 මහාවංසො, 03 පරි, 04 ගාථා, 10 පි.

68 හියුං සියැං භ්‍රමණ වෘත්තාන්ත, 324 පි.

සම්මුඛ ශ්‍රාවක මහාකාශ්‍යපාදී තෙරවරුන් විසින් කළ බැවින් 'ථෙරියා පරම්පරා - ස්ථවිරයන්ගේ පරම්පරාව' [69] යැයි වාර්තා කොට ඇත. මෙහි චතුපටිසම්භිදාලාභී ආධ්‍යාත්මික ශික්ෂණය ලැබූ ස්ථිර ගුණයෙන් යුක්ත වූ බැවින් 'ථෙරා ථිරගුණූපෙතා' [70] යනුවෙන් ද වාර්තාවෙහි දක්වේ. උක්ත වාර්තාවන්හි විද්‍යමාන යෙදුම් තුළින් ම ථෙර, මහාථෙර, සංඝථෙර යනු ආධ්‍යාත්මික ශික්ෂණය සාක්ෂාත් කළ, ස්ථිර ගුණයෙන් යුක්ත,[71] ගුණවෘද්ධ, තපෝවෘද්ධ, වයෝවෘද්ධ මහාත්මය නිසා හෝ එවකට පවරනු ලැබූ අගතනතුරු මත හෝ භාවිත අභිධානයන් ලෙස සැලකිය හැකි ය. උන්වහන්සේලා ධර්ම - විනය මෙයැයි තහවුරු කළ වාදය ම ථෙරවාදය[72] බවත්, ඔවුන්ගේ අඛණ්ඩ ව පැවැත්ම 'ථෙරියා පරම්පරා - ස්ථවිරයන්ගේ පරම්පරාව බවත්, ඔවුන් ආරක්ෂා කළ සම්ප්‍රදාය ථෙරවාද සම්ප්‍රදාය බවත්, පෙළෙහි ඇතුළත් ථෙරවාද පාලි ප්‍රයෝගය ද මෙයට සමානාර්ථ බවත් පැවසිය හැකි ය.

'ථෙරවාද' ව්‍යවහාරය දෙවැනි ධර්ම සංගීතියෙන් පසු සංගීතිවාර්තාවන්හි ඇතුළත් ව, එම සංගීතියෙන් පැන නැඟුණක් ලෙස ප්‍රකට වුවත්, පළමුවැනි ධර්ම සංගීතිය තුළ ම ස්ථවිර භික්ෂූන් අතර ඇති වූ 'වාද' හඳුනාගත හැකි ය. එහි ඇතුළත් ප්‍රයෝගය වන්නේ 'එකච්චෙ ථෙරා - ඇතැම් තෙර කෙනෙක් මෙසේ කීහ' [73] යන්න යි. ඛුද්දානුඛුද්දක සික්ඛාපද කථාව තුළ විද්‍යමාන 'එකච්චෙ - ඇතැම්' යන ප්‍රයෝගය සය වරක් යෙදී ඇත. ඉන් ගම්‍ය වන්නේ ස්ථවිර භික්ෂූන් අතර ම ධර්ම-විනය කරුණු තීරණය කිරීමේ දී 'වාද' පැනනැඟි බව යි. එසේ ම පන්සියයක් පමණ භික්ෂු සමූහයාට නායක වූ පුරාණ තෙරුන්ට සංගීතිය පැවැත්වූ බව දැනුම් දීමේ පිළිසඳර කථාව ද වැදගත් වේ. බුදුරදුන් ජීවමාන අවධියේ ම

69 ථෙරෙහෙව කතත්තාව - ථෙරියායං පරම්පරා
මහවංසො,03 පරි., 40 ගා., 12 පි.

70 ථෙරා ථිරගුණූපෙතා - සම්බුද්ධමත කොවිදා.
මහවංසො, 03 පරි., 15 ගා., 11 පි.

71 ථිර ගුණූපෙතාති ථිර ගුණෙහි උපෙතා, ථිරගුණූපෙතා, කිලෙස පච්චත්ථිකෙහි අනභිභවනීයත්තා ඛීණාසවාදී ගුණා ථිරගුණා නාම ජාතා. තෙහි උපෙතා සමන්නාගතාති තෙ ථෙරා ථිරගුණූපෙතාති වුච්චන්ති.
වංසත්ථප්පකාසිනී, 145 පි.

72 ථෙරෙහි කත සංගහො - ථෙරවාදොති වුච්චති
දීපවංසො.04 පරි., 11 ගා. 20 පි.

73 චුල්ලවග්ග පාළි, ෂෂ, 552 පි.

සම්මුඛ ශ්‍රාවකවරුන් කණ්ඩායම් වශයෙන් ඒ ඒ ප්‍රදේශවල වෙන වෙන ම ශිෂ්‍යානුශිෂ්‍ය සමූහයාට ප්‍රමුඛ ව කටයුතු කළ බවට මෙය ප්‍රබල සාධකයකි. බුදුරදුන් වෙතින් අසා දැන ගත් ධර්ම - විනයට අනුව ශිෂ්‍යගණයා පුහුණු කළත්, වෙන් වෙන් ව කටයුතු කිරීමේ දී අත්තනෝමතයන් ද එක්වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. උක්ත පිළිසඳරෙහි දී 'පුරාණ ආයුෂ්මතුන්ට ස්ථවිර භික්ෂූහු මෙසේ කීහ - ආයස්මන්තං පුරාණං ථෙරා භික්ඛූ එතදවොචුං'[74] යන සඳහන තුළ ම එය පැහැදිලි වේ. පුරාණ තෙරුන් වර්ණනාත්මක ව එම සංගීතිය පිළිගැනීම[75] හෝ නො සතුටින් ප්‍රතික්ෂේප කිරීම හෝ සිදුවුවත්, වෙන ම කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කළ බව තහවුරු වේ.

පළමු ධර්ම සංගීතියේ දී 'එකච්චෙ ථෙරා - ඇතැම් ස්ථවිරවරුන්' යන්නෙන් පැන නැඟුණු ධර්ම-විනය වාදයන්, දෙවැනි ධර්ම සංගීතියට පසුබිම ව 'වාද' ප්‍රයෝගයෙන්, විනයවාදී - අවිනයවාදී,[76] ධම්මවාදී - අධම්මවාදී,[77] එවංවාදී,[78] යුක්තවාදී[79] දෙවැනි ධර්මසංගීතියෙන් ද ඉන් භින්න වූ සංඝයාගේ මහාසාංඝික සංගීතියෙන් ද පසු ඔවුනු පක්ෂ විපක්ෂ ව 'වාදී' වූහ. දෙවැනි ධර්ම සංගීතියේ නායකත්වය දැරූ සබ්බකාමී තෙරුන්, පළමු සංගීතිකාරක ආනන්ද තෙරුන්ගේ සද්ධිවිහාරික උපසම්පදාවෙන්, එක්සිය විසිවස් ඇති, මුළු පෘථිවියෙහි 'සංඝථෙර' වීම ද විශේෂ වූවකි.

සම්ප්‍රදායවාදී 'ථෙරවාද' ප්‍රයෝගය ප්‍රභවයෙහි ලා ආධ්‍යාත්මික ශික්ෂණය සාක්ෂාත් කළ බැවින් 'මහරහත්' වීම ද උපසම්පදාවෙන් එක්සිය විසිවස් ඇති බැවින් 'මහාථෙර' වීම ද යන කරුණු දෙකින් ම ආධ්‍යාත්මික අර්ථයත්, පැවිද්දෙහි වෘද්ධ භාවය ප්‍රකාශිත අර්ථයත්, සබ්බකාමී තෙරුන් වෙතින් තහවුරු වේ. උන්වහන්සේ දෙවැනි ධර්ම සංගීතියේ නායකත්වය දැරූවේ 'සංඝථෙර' වූ බැවිනි. එබැවින් උන්වහන්සේලා ධර්ම - විනය

---

74 චුල්ලවග්ග පාළි, ෂෂ, 552 පි.,
ආයස්මන්තං පුරාණං ථෙරා භික්ඛූ එතදවොචුං: ථෙරෙහි ආවුසො පුරාණ, ධම්මො ච විනයො ච සංගීතො. උපෙහි තං සංගීතන්ති. සුසංගීතාවුසො ථෙරෙහි ධම්මො ච විනයො ච, අපි ච යථෙව මයා භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. තථෙවාහං ධාරෙස්සාමීති.

75 මහාවග්ගපාළි, ෂ, ප්‍රස්තාවනාව, ඛඨ පි.

76 චුල්ලවග්ග පාළි, ෂෂ, 574 පි.

77 එම.

78 එම, 570 පි.

79 එම, 572 පි.

පිළිබඳ ව ගොඩනැගූ 'වාද' ශාසන චිරස්ථිතියට උපස්තම්භක වූ බැවින් ම,[80] පෙළෙහි අර්ථයත්, ආධ්‍යාත්මික අර්ථයත්, සම්ප්‍රදායවාචී අර්ථයත් කහවුරු වේ. උක්තාර්ථ සාධනය වීම තුළ 'ථෙරවාදය' ස්ථාපිත වූ බවත්, පළමුවැනි ධර්ම සංගීතියෙන් සංගීත වූ මුල් බුදුසමය ඇතුළත් ව ථෙරවාදය, ථෙරීය පරම්පරා විසින් ආරක්ෂා කොට පවත්වාගෙන පැමිණ ඇත.[81] එසේ පවත්වාගෙන පැමිණීම නිසා සම්ප්‍රදායත් ගොඩනැගී තිබේ. තෙරවරුන් පරපුරින් පරපුරට ආරක්ෂා කළ සම්ප්‍රදාය බැවින්, ථෙරවාද සම්ප්‍රදාය කාලානුක්‍රමික ව ස්ථාපිත වී තිබේ. මහින්දාගමනයෙන් ලක්දිවට පැමිණි ථෙරවාදය මහාවිහාරය කේන්ද්‍රකොට ක්‍රි.පූ. පළමු සියවසේ දී පොත්තකසංගීතියෙන් ග්‍රන්ථාරූඪ වීමත්,[82] ක්‍රි.ව. 05 වැනි සියවසේ සිට පාලිමුත්තක අට්ඨකථා, ටීකා රචනා කිරීමත් තුළින්[83] ථෙරවාද සම්ප්‍රදාය ස්ථාවර ව සුරක්ෂිත කොට තිබේ.

උක්ත ථෙරවාද සම්ප්‍රදාය දේශාන්තර ව්‍යාප්තියට පත් ව ලංකාව, සියම, බුරුමය ආදී රටවල අඛණ්ඩ ව වර්තමානය දක්වා ආරක්ෂා කොට පවත්වාගෙන පැමිණ තිබේ. මේ අනුව ථෙරවාදයත්, ථෙරවාද සම්ප්‍රදායත් අග්‍රවාදය[84] ලෙස ලංකාවේ ඓතිහාසික මූලාශ්‍රයවල වාර්තා කොට ඇති බවත් පෙනේ.

බුද්ධභාෂිත ධර්ම විනය සංඛ්‍යාත ත්‍රිපිටකය ම පාළිය යි. එය ශ්‍රීමුඛ පාළි, ශ්‍රාවක පාළි, සංගීතිකාරක පාළි[85] යැයි ප්‍රභේද වූවත්, ඒ සියල්ල ත්‍රිපිටකය තුළ ම ඇතුළත් වේ. ශාස්තෲන් වහන්සේ ම මූලික කොට ප්‍රභවය වූ පාළියේ ඓතිහාසික සම්බන්ධයත්, ථෙරවාද මහාසාංඝික භේදයෙන්, ථෙරවාද සම්ප්‍රදාය පාළි සම්ප්‍රදාය ලෙසත්, එය භාෂා මාධ්‍යය බවට පත් වූ ආකාරයත් මෙහි ලා විමර්ශනය කළ යුතු වේ.

---

80 ඉච්ඡන්තො සො මහාථෙරො, සාසනස්ස චිරට්ඨිතිං
මහාවංසො, 03 පරි, 05 ගා., 10 පි.

81 සාරත්ථදීපනී, 113 පි.

82 චිරට්ඨිතත්ථං ධම්මස්ස - පොත්ථකෙසු ලිඛාපයුං.
දීපවංසො, 20 පරි., 21 ගා., මවපා. ෂ. ප්‍රඥාවංශ, බඩ - බංසස පිටු.

83 පාළිං ගහුං ථෙරයි වාචරියා,
දීපවංසො, 23 පරි., 29. 30. 31 ගාථා.

84 තස්මාහි සො ථෙරවාදො - අග්ගවාදොති වුච්චති
එම, 04 පරි, 32 ගා., 21 පි.

85 බෞද්ධ සාහිත්‍යය, 140 පි.

පළමු ධර්ම සංගීතිය පැවැත්වීමේ මූලාර්ථයන් වූයේ,

1. විසිරී පැතිරී පැවති ධර්ම - විනය ඒකරාශී කිරීම
2. එක්රැස් වූ ධර්ම - විනය සංග්‍රහ කිරීම (පිටක, නිකායාදී වශයෙන් සිදු කළ සංග්‍රහය)
3. අධර්මවාදීන් බලවත් වීමටත්, ධර්මවාදීන් දුබලවීමටත් අවිනයවාදීන් බලවත් වීමටත්, විනයවාදීන් දුබලවීමටත් පෙර ධර්ම විනය සංගායනා කිරීම.[86]
4. ධර්ම විනය සුරක්ෂිත ව අනාගතය කරා පවත්වාගෙන යෑමේ ක්‍රමවේදයක් සැකසීම[87] ආදිය යි.

(දීඝනිකාය - ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වූ දීඝ භාණකයන්,
මජ්ඣිමනිකාය - සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වූ මජ්ඣිම භාණකයන්,
සංයුත්තනිකාය - මහාකාශ්‍යප තෙරුන් ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වූ සංයුත්ත භාණකයන්
අංගුත්තරනිකාය - අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වූ අංගුත්තර භාණකයන්,
විනය පිටකය - උපාලි තෙරුන් ඇතුළු ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වූ විනය භාණකයන් ආදී භාණකයෝ ම ත්‍රිපිටකය ආරක්ෂාවෙහි, පෝෂණයෙහි නියුක්තයෝ වූහ.[88] මෙසේ පළමු ධර්ම සංගීතිකාරක මහතෙරවරු එක්රැස් කොට සංග්‍රහ කළ ධර්ම - විනය, භාණක පරපුර විසින් බුද්ධ පරිනිර්වාණයෙන් සියවසක කාලයක් තුළ සුරක්ෂිත කරනු ලැබීය. එය බුද්ධභාෂිත ත්‍රිපිටකය[89]යි.

දෙවැනි ධර්ම සංගීතිය පැවැත්වීමේ අභිමතාර්ථයන් වූයේ ද,

1. විනය විනය ලෙසත්, අවිනය අවිනය ලෙසත්, ධර්මය ධර්මය ලෙසත්, අධර්මය අධර්මය ලෙසත් වෙන් කොට හඳුනා ගැනීම[90]

---

86 චුල්ලවග්ගපාළි., II, 546 පි.
87 බෞද්ධ සාහිත්‍යය, 45 පි.
88 මහාවග්ගපාළි. II, ප්‍රස්තාවනාව, ඛංස පි.
89 පිටකං තීණි සංගීතිං අකංසු
චුල්ලවග්ගපාළි, II, 564 පි.
90 එම, 574 පි.

2. ධර්ම - විනයට එරෙහි ව පැන නැඟි දස වස්තුව නම් වූ අධිකරණය විනිශ්චය කිරීම[91]
3. අධර්මවාදී හා අවිනයවාදීන්ගේ බලය තහවුරු වීමට පෙර ධර්මවාදී හා විනයවාදීන්ගේ බලය තහවුරු කිරීම.
4. පළමුවැනි ධර්ම සංගීතියෙන් සුරක්ෂිත කළ ධර්ම - විනය සංඛ්‍යාත ත්‍රිපිටක බුද්ධභාෂිතය අධර්ම අසංකරයෙන්[92] සුරක්ෂිත කොට ඉදිරියට පවත්වාගත යුතු යන කරුණු යි.

දෙවැනි සංගීතිකාරක මහතෙරවරු බුද්ධභාෂිත ත්‍රිපිටකය අධිකාරීත්වයෙහි තබා පැනනැඟි අධිකරණය විනිශ්චය කොට, ධර්මවිනය සුරක්ෂිත කළහ. පළමු ධර්ම සංගීතියෙන් සංගෘහීත වූ බුද්ධභාෂිත ත්‍රිපිටකය, දෙවැනි ධර්ම සංගීතියෙන් අනුසංගීත විය.[93] මෙසේ සංගීතිකාරක මහතෙරවරුන් විසින් සංගීත වූ අනුසංගීත වූ ත්‍රිපිටකය පාළිය[94]යි. එනම්, ධම්ම විනය යි.

දෙවැනි ධර්ම සංගීතිය සඳහා රැස්වූ දොළොස් දහසක් භික්ෂූන් අතුරින්, සංගීතියට තෝරා ගනු ලැබුයේ සත්සියයක්[95] පමණි. උන්වහන්සේලා පටිසම්භිදාලාභී, ත්‍රිපිටකධාරී මහරහතන් වහන්සේලා ම[96] වූහ. එබැවින් 'සත්තසතිකා විනයසංගීති' යැයි ද කියනු ලැබේ. විශාලාවේ කූටාගාර ශාලාවෙහි පැවති එම ධර්ම සංගීතියෙන් පසු, දසවස්තුව රැගත් වජ්ජිපුත්තකාදී දසදහසක් භික්ෂූහු, අධර්මවාදී, අවිනයවාදී පාපී භික්ෂු යැයි

---

91 එම., II" 566 පි.
*මහාසාංඝිකාදීන්ට අනුව රහතන් වහන්සේ පිළිබඳ පසේව වස්තුවයි. (Buddhist seets in india by Nalinaksha Dutt, Chai.)
92 විමති විනෝදනී ටීකා, 26 පි.
93 වසීසතෙහි පඤ්චහියා සංගීතා අනුසංගීතා ච පවත්‍රාපි.
මනොරථපූරණී, ෂ, 01 පි.
94 සබ්බං ථෙරවාදන්ති - ද්වෙ සංගීතියො ආරුළ්හා පාළි.
විමති විනොදනී ටීකා, 26 පි.
සබ්බං ථෙරවාදංති - ද්වෙ සංගීතියො ආරුළ්හ පාළියෙවෙත්ථ ථෙරවාදොති වෙදිතබ්බං. සාරත්ථදීපනී, 113 පි.
95 ඉමායං ඛො පන විනය සංගීතියා සත්ත භික්ඛුසතානි අනූනානි අනධිකානි අහෙසුං තස්මායං විනයසංගීති සත්තසතිකාති වුච්චති
චුල්ලවග්ගපාළි, ෂෂ, 598 පි.
96 සබ්බෙපි විසුද්ධ වත්ථු - සමාපත්තිම්හි කොවිදා
දීපවංසො, 04 පරි. 63 ගා, 24 පි.

[illegible] ලැබූහ.[97] එසේ නෙරපූ දස දහසක් පමණ වූ භික්ෂූහු පාටලී පුත්‍රයේ [illegible] කාලන්දාවේ දී[98] හෝ විශාලාවෙන් උතුරු ප්‍රදේශයේ කොසඹෑ නුවර [illegible]ආරාමයේ[99] හෝ එක්රැස් ව සංගායනාවක් පැවැත්වූහ. වසුමිත්‍ර, භව්‍ය, [illegible]දේව ආදීන් ප්‍රධාන කරගත් තිබ්බතීය චාර්යා මගින් ප්‍රකට වන්නේ[99] [illegible]දේව තෙරුන්ගේ හෝ සුභද්‍රගේ රහතන් වහන්සේ පිළිබඳ පඤ්චවස්තුව පදනම් කොටගෙන පවත්වා ඇති බව යි. රහතන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ, පඤ්ච වස්තුවට පක්ෂ ව ඡන්දය ප්‍රකාශ කළ පිරිස 'මහාසාංඝික' බවත්, විපක්ෂ ව ඡන්දය දුන් පිරිස 'ථේරවාදීන්' බවත් කියැවේ.[100] දෙවැනි ධර්ම සංගීතියෙන් නෙරපනු ලැබූ, 'මහාසාංඝික' සංගීතිය පිළිගත් භින්න ලබ්ධික භික්ෂූහු, පාළි ත්‍රිපිටකය සුරක්ෂිත කළ ස්ථවිර භික්ෂූන් වහන්සේ හා එම අනුසංගීතිය 'ථේරවාද' ප්‍රවාදයෙන් විවේචනය කළහ.[101] මේ නිසා සංගීතිකාරක මහතෙරවරු 'ථේරවාදීන්' ලෙසත්, උන්වහන්සේලා අනුසංගීතියෙන් සුසංගීත ව තහවුරු කළ පාළි ත්‍රිපිටකය 'ථේරවාදය' ලෙසත් අර්ථවත් කෙරේ.

මීට ප්‍රතිපක්ෂ ව මහාසාංඝිකවාදය තහවුරු වුවත්, එම භික්ෂූහු ද පළමු ධර්ම සංගීතියෙන් සංගෘහිත ධර්ම -විනය සංඛ්‍යාත ත්‍රිපිටක පාළිය පිළිගත්තාහුය. ඔවුන් වෙන ම සංගීතියක් පවත්වනු ලැබූවත්, එම සංගීතිය ද බුද්ධභාෂිත ත්‍රිපිටක පාළිය පදනම් කොට ම පැවැත්විය යුතු වේ. ධර්ම - විනය ශික්ෂාවන් පිළිබඳ පෞද්ගලික පිළිගැනීම කෙබඳු වුවත්, ශාස්තෘභාෂිත ත්‍රිපිටක පාළිය ගැන විවාදයක් පැවතිය නො හැකි බැවිනි.

එහෙත් මහාසාංඝිකවාදීහු එතෙක් සුරක්ෂිත ව පැවති ශාක්‍යපුත්‍රීය ශ්‍රමණ සම්ප්‍රදායයේ ඒකීයභාවය දෙකඩ කළා පමණක් නො ව, බුද්ධභාෂිත ත්‍රිපිටක පාළිය ද විභේදනය කළහ. පළමු ධර්ම සංගීතියෙන් සංගෘහිත ත්‍රිපිටක පාළිය වූ මූලසංග්‍රහය බිඳ වෙනත් සංග්‍රහයක් කළ බවත්, එහිදී ධර්ම - විනයෙහි අර්ථයත් ධර්මයත් බිඳහෙළූ බවත් දැක්වේ.[102] මහාසාංඝිකවාදීහු

97 එම, 04 පරි, 69 ගා, 24 පි.
98 ලක්දිව මහායාන අදහස්, 20 පි.
99 Life of the Buddha, එග 181.
100 බෞද්ධ සාහිත්‍යය, 68 පි.
101 යාහි මහාසාංඝිකාදීහි භින්න ලද්ධිකා විවෙචෙතුං ථේරවාදානි වුත්තා.
විමති විනෝදනී ටීකා, 26 පි.
102 මහාසාංඝිකා භික්ඛූ - විලෝමං අකංසු සාසනං
භින්දිත්වා මූලසංගහං - අඤ්ඤං අකංසු සංගහං

ත්‍රිපිටක පාළි මූලසංග්‍රහයේ ඇතුළත් ධර්ම - විනයේ ව්‍යඤ්ජන ඡායාව පමණක් ගෙන අර්ථය විනාශ කළ බැවින්, පළමු ධර්ම සංගීතියේ දී එකඟ ව පිළිගත් ශාස්තෘභාෂිතය, තමන් විසින් ම ඡේදනය කිරීම තුළ සිදු වූයේ, නැවත එක් කළ නො හැකි ලෙස ශාසනයේ ඒකීයත්වය ම විච්ඡේදනය කිරීමකි. මේ නිසා පළමු, දෙවැනි ධර්ම සංගීතිකාරක මහතෙරවරුන් මුල් ම භික්ෂු පරපුරේ අනුල්ලංඝනීය සාමාජිකත්වය වූ බවත්, උන් වහන්සේලා ත්‍රිපිටක පාළියේ මූලසංග්‍රහය ස්ථාවර කළ බවත් මූලාශ්‍රය මගින් සනාථ වේ. එබැවින් මෙහි ලා කරුණු දෙකක් තහවුරු වේ.

1. භික්ෂු පරපුරේ අනුල්ලංඝනීය ලෙස පැවතෙන සාමාජිකත්වය 'ථේරවාද සම්ප්‍රදාය' ලෙසත්, උන්වහන්සේලා සුරක්ෂිත කළ ත්‍රිපිටක පාළියේ මූලසංග්‍රහය 'ථේරවාදය' ලෙසත් සැලකිය හැකි බව පළමු වැන්න යි.
2. දෙවැනි ධර්ම සංගීතියෙන් භේද වූ වජ්ජිපුත්තකාදී භික්ෂූන් සිදු කළ මහාසාංඝික සංගීතියෙන් පසු මුල් ම භික්ෂු පරපුරේ පැවැත්ම උල්ලංඝනය කොට එයින් භින්න වූ සාමාජිකත්වයත්, ත්‍රිපිටක පාළියේ මූල සංග්‍රහය විච්ඡේදනය කොට සිදු කළ

---

අඤ්ඤත්‍ර සංගහිතං සුත්තං - අඤ්ඤත්‍ර අකරිංසු තෙ
අත්ථං ධම්මඤ්ච භින්දිංසු - විනයෙ නිකායෙසු පඤ්චසු

පරියාය දෙසිතං චාපි - අථො නිප්පරියාය දෙසිතං
නීතත්ථං චෙ'ව නෙය්‍යත්ථං - අජානිත්වාන භික්ඛවො

අඤ්ඤං සන්ධාය භණිතං - අඤ්ඤත්ථං ඨපයිංසු තෙ
ව්‍යඤ්ජනච්ඡායාය තෙ භික්ඛූ - බහුං අත්ථං විනාසයුං

ඡඩ්ඩෙත්වාන එකදෙසං - සුත්තං විනය ගම්භීරං
පතිරූපං සුත්තවිනයං - තඤ්ච අඤ්ඤං කරිංසු තෙ

පරිවාරං අත්ථුද්ධාරං - අභිධම්මං ඡප්පකරණං
පටිසම්භිදඤ්ච නිද්දෙසං - එකදෙසඤ්ච ජාතකං
එත්තකං විස්සජ්ජෙත්වාන - අඤ්ඤානි අකරිංසු තෙ

නාමං ලිංගං පරික්ඛාරං - ආකප්ප කරණීයානි ච
පකතිභාවං ඡඩ්ඩෙත්වා - තඤ්ච අඤ්ඤං අකංසු තෙ
දීපවංශය, 04 පරි, 71-78 ගා, 25 පි.

අනාඝ සංග්‍රහය තුළ මහාසාංඝික ආදී වාදයන් හා ඊට අයත් සම්ප්‍රදායයන් ගොඩනැඟුණු බවත් පැලකිය හැකි බව දෙවැන්න යි.

ථෙරවාද සම්ප්‍රදාය, පාලි සම්ප්‍රදාය ලෙස මහාසාංඝිකාදීන් හඳුන්වා ඇත්තේ භාෂා මාධ්‍යයක් ලෙස සලකා නො වේ. බුද්ධභාෂිත ත්‍රිපිටක පාලියේ මූලසංග්‍රහයත්, එය ඡේදනය කොට සැකසූ අනාඝ සංග්‍රහයත් හැඳින්වීම සඳහා විය යුතු ය. පසුකාලීන ව ථෙරවාද සම්ප්‍රදාය ආරක්ෂා කොට පවත්වාගෙන යෑමේ භාෂා මාධ්‍යය පාලිය බවට පත්ව තිබේ. බුද්ධභාෂිත ත්‍රිපිටක පාලිය භාෂා මාධ්‍යයක් බවට පත්වූයේ කවර කාලයක සිට දැයි නිශ්චිත ව පැවසිය නො හැකි ය.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයත් දෙසිය තිස් හයත් අතර අටළොස් නිකායක් බිහිවූ බවත්, ඒවා අතරින් ථෙරවාදීන් පාලිය භාෂා මාධ්‍යය ලෙසත්, මහාසාංඝිකයින් ප්‍රාකෘතය භාෂා මාධ්‍යය ලෙසත්, සර්වාස්තිවාදීන් සංස්කෘතය භාෂා මාධ්‍යය ලෙසත් භාවිත කළහ යි[103] දක්වේ. එසේ නම් මහාසාංඝික සංගීතිය ප්‍රාකෘත භාෂා මාධ්‍යයෙන් සිදු කළා ද? නොඑසේ නම් එම සම්ප්‍රදාය පවත්වාගෙන යෑමට ප්‍රාකෘතය භාවිත කළා දැයි අවිනිශ්චිත යි. දැනට සොයාගෙන ඇති මහාසාංඝිකයින්ගේ විනය මහාවස්තුව, ථෙරවාදීන්ගේ මහාවග්ග පාලිය මෙන්, ආරම්භයෙහි බුද්ධ චරිතයත්, පසුව විනය ප්‍රඥප්තීන් ප්‍රකට වන ග්‍රන්ථයකි. මෙහි එක් කොටසක් සංස්කෘත - ප්‍රාකෘත මිශ්‍ර පද්‍ය මාධ්‍යයෙන් රචනා කොට ඇතැයි මොරටුවේ ශාසනරතන හිමියෝ[104] දක්වති. ක්‍රි.ව. 120-162 අතර කාලයෙහි ලක්දිව ස්ථවිරවාදීන් හැර සෙසු සියලු නිකායිකයින් ඒකරාශී කොට සිදු කළ කණිෂ්ක ධර්ම සංගීතිය සංස්කෘත භාෂා මාධ්‍යයෙන් සිදු කළහ යි[105] පැවසේ. එම සංගීතියෙන් පසු මහායානය බිහිවූ බවත්, එය භාරතයෙහි වේගයෙන් ව්‍යාප්ත වූ බවත් දක්වේ. මීට හේතුව ලෙස මහායාන භික්ෂූන් වැඩිදෙනා බ්‍රාහ්මණ වංශිකයන් වීම නිසා ද මේ සියලු දෙනා ම සංස්කෘත භාෂාව මැනවින් හදාළ පඬිවරුන් වීම නිසා යැයි මොරටුවේ ශාසනරතන හිමියෝ කියති.[106]

අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ බුද්ධ වචන සංඛ්‍යාත

103 විචාරෝභාස, 306 පි.

104 ලක්දිව මහායාන අදහස්, 4, 36 පි.

105 විචාරෝභාස, 136 පි.

106 එම., 138 පි.

ත්‍රිපිටක පාළිය, පළමු ධර්ම සංගායනාවෙන් සංගීතව, දෙවැනි හා තෙවැනි සංගීති වලින් සුසංගීතව තහවුරු වූ බවයි. ත්‍රිපිටක පාළිය ක්‍රි. ව. 5 වැනි සියවස තෙක් මාගධී නමින් ද පසුව එය පාළිය බවට පත් වී තිබේ. නිකායාන්තර පහළ වීමෙන් පසුව ද ත්‍රිපිටක පාළිය රැකගත් අඛණ්ඩ භික්ෂු සම්ප්‍රදාය ථේරවාදීන් වන බවත්, ථේරවාදීන්ගේ මාධ්‍ය භාෂාව පාළිය බවත් නිගමනය වේ.


ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

- චුල්ලවග්ගපාළි, දුතිය භාගය, බු.ජ.මු. මාලා (52), ශ්‍රී ලංකා සමාජවාදී ජනරජ ප්‍රකාශනය, 1983.
- දීපවංසො, දුතිය භාගය, අකුරැටියේ විමලකිත්ති හිමි සංස්කරණය, විද්‍යාවිලාස යන්ත්‍රාලය, 1959.
- ධම්මපියා අටුවා ගැටපදය, මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සංස්කරණය, එම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, ද්විතීය මුද්‍රණය, 1967.
- පපඤ්චසූදනී, සයිමන් හේවාවිතාරණ සංස්., 1943.
- මජ්ඣිමනිකාය, මූලපණ්ණාසකය, බු.ජ.මු. 10, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1962.
- එම, මජ්ඣිම පණ්ණාසකය, බු.ජ.මු. 11, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1973.
- එම, උපරි පණ්ණාසකය, බු.ජ.මු. 11, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1973.
- මනෝරථපූරණී, සයිමන් හේවාවිතාරණ සංස්., 1923.
- මහාවංසො, පොල්වත්තේ බුද්ධදත්ත හිමි සංස්., එම්.ඩී. ගුණසේන ප්‍රකාශනය, 1959.
- මහාවග්ගපාළි, ප්‍රථම භාගය, බු.ජ.මු. 03, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1957.
- මහාවග්ගපාළි, දුතිය භාගය, බු.ජ.මු. 04, ලංකාණ්ඩු ප්‍රකාශනය, 1957.
- විනයාලංකාරය, ඡට්ඨසංගායනා සීඩී.
- විමතිවිනෝදනී ටීකා, බෙරේතුඩුවේ ධම්මාධාර තිස්ස හිමි සංස්කරණය, එච්. ගේබ්‍රියෙල් ද සිල්වා ප්‍රකාශනය, 1935.
- සමන්තපාසාදිකා, පළමු භාගය, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, ත්‍රිපිටක මුද්‍රණාලය, 1929.
- සාරත්ථදීපනී, තිස්සව දේවරක්ඛිත හිමි සංස්කරණය, ඩී.සී. වික්‍රමසිංහ ප්‍රකාශනය, 1914.
- සුමංගලවිලාසිනී, සයිමන් හේවාවිතාරණ සංස්. ත්‍රිපිටක මුද්‍රණාලය,